රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
Ministry of Public Administration and Management

ආයතන අංශය
தாபனப் பிரிவு
Establishments Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.

| | | | |
|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி :011-2696211-13<br>Telephone | ෆැක්ස්<br>பெக்ஸ் :011-2692158<br>Fax | ඊ-මේල්<br>ஈ-மெயில் :dge@pubad.gov.lk<br>E-mail | වෙබ් අඩවිය<br>இணையதளம் :www. pubad.gov.lk<br>Website |

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல :<br>My No — EST/8/ALOWN/05/0029 | ඔබේ අංකය<br>உமது இல :<br>Your No — MA/MS/... | දිනය<br>திகதி :<br>Date — 2016.01.18 |

ලේකම්

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සේවාස්ථ පුහුණු පාඨමාලා සඳහා ගෙවනු ලබන දීමනා සංශෝධනය කර ගැනීම

ඔබේ සමාංක හා 2015.12.23 දිනැති ලිපිය හා සම්බන්ධ වේ.

02. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය ද සැලකිල්ලට ගෙන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සේවාස්ථ පුහුණු පාඨමාලා සඳහා සහභාගීවන සම්පත්දායකයින්ට ඒ සඳහා වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමේ පදනම මත 2016 වර්ෂය සඳහා පහත පරිදි දීමනා ගෙවීම අනුමත කරමි.

**දේශන ගාස්තු - දිනකට පැය 03 ක උපරිමයකට යටත්ව**

| | | |
|---|---|---|
| I. | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවා වල I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැයකට | - රු. 900/- |
| II. | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවා වල II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැයකට | - රු. 800/- |
| III. | ශ්‍රී ලංකා පරිපාලන සේවය හා සමාන්තර දීප ව්‍යාප්ත සේවා වල III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැයකට | - රු. 700/- |
| IV. | උපාධිධාරීන් සඳහා පැයකට | - රු. 600/- |
| V. | අනෙකුත් සුදුසුකම් සහිත දේශකයින් සඳහා පැයකට | - රු. 500/- |

SECRETARY
20 JAN 2016
922

22 JAN 2016
263

Addl sec (Admin)
DDG (ET & R)
D/MS

026 2234546

38

3

DDG (Ad)
DDG (ET and R)
D MS

Addl. S / Ad

03. සහාය කාර්ය මණ්ඩලය සඳහා දීමනා ගෙවීම සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ විමසා ඇති අතර ඒ පිළිබඳව අවසන් තීරණයක් පසුව දන්වා එවන බව කාරුණිකව දන්වා සිටිමි.

04. එසේම මෙම දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් අමතර ප්‍රතිපාදන නොඉල්ලිය යුතු බවත්, ඉහත කාර්යයන් සඳහා නිලධාරීන් යොදවා ගැනීමේදී අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අවසරය මත ඔහුගේ සාමාන්‍ය රාජකාරිවලට බාධාවක් නොවන සේ ක්‍රියා කිරීම සිදුකළ යුතු බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

05. තවද ඉහත ලිපියේ සඳහන් දේශන ගාස්තු ලෙස දිනකට පැය 03 ක උපරිමයකට යටත්ව දීමනා ගෙවීමට අමතරව සම්පත් නිලධාරීන් යනුවෙන් සඳහන් කර දිනකට දීමනාවක් ගෙවීමට අනුමතිය විමසා ඇත්තේ කුමන කාර්යයක් සඳහා ද යන්න මා දැනුවත් කළ පසු ඒ පිළිබඳව අවසන් තීරණයක් දන්වා එවන බව ද කාරුණිකව දන්වා සිටිමි.

අ.කළේ./ඩබ්ලිව්.ඩී. සෝමදාස
ආයතන අධ්‍යක්ෂ ජනරාල්

සංජීවනී වීරසේකර
සහකාර ආයතන අධ්‍යක්ෂ

පිටපත්: 1. විගණකාධිපති

2. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව- ඔබේ අංක NPC/6/25/AL-II හා 2015.04.29 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.